*Complements from D's GYM*

D's GYM
MATTEGODA

"IF YOU ARE
WAITING
FOR THE
RIGHT TIME,
IT'S
NOW.

077 445 4034

146/121, SALMAL UYANA,
MATTEGODA.




# The Silver Jubilee of St. Jude's Church Mattegoda

Year 1992 - 2017

"Homes are built on the foundation of wisdom and understanding.
Where there is knowledge, the rooms are furnished with valuable, beautiful things."

Proverbs 24:3-4



# ජුබිලී මංගල්‍ය වෙනුවෙන් යාච්ඤාව

අතී ශුද්ධ අපෝස්තුළුවරයාණන් වූ ශාන්ත ජූඩ් තදේවුස් තුමෙනි, ජේසු ක්‍රිස්තුස් තුමන්ගේ ඥාතිවරයාණෙනි, ගුණ ධර්මයන්ගෙන් හා ප්‍රාතිහාර්යය බලයෙන් සුප්‍රකට මහිමෝත්තම ප්‍රාණ පරිත්‍යාගිකයාණනි ඔබට ගෞරවකරන්නා වූ සියල්ලන්ට නොවරදවා, නොපමාව සහය වෙන මධ්‍යස්ථකාරයාණෙනි ඔබවහන්සේ අපට බලගතු ආරක්ෂකයෙක්ද, විපත්තිවලදී සහකාරයෙක්ද වන්නේය. බලාපොරොත්තු අත්හැර දැමුවන්ට ප්‍රත්‍යක්ෂ ලෙසම සහය වීමේ දීමනාව දෙවියන්වහන්සේගෙන් ලබාගත් ඔබ සිය බලවත් මැදිහත්කමින් අපගේ සහයට වැඩිය මැනව! අප දෙස ඔබගේ නෙත් යොමු කල මැනව ! විසිපස් වසරක් පුරාවට දුබල වූ අප දෙස බලා, අපගේ සියලු අවශ්‍යතාවයන් ජේසුතුමන් මඟින් ලබාදී අප වෙත දැක් වූ අසීමිත දයාව කරුණාවට අපි ඔබතුමන්ට අපගේ හෘදයාංගම ස්තූතිය පුද කරමු. මෙම ජුබිලි මංගල්‍යය තව තවත් දේවජනතාවට එකමුතුව වැඩි වර්ධනය කර ගැනීමටත් දෙවියන්වහන්සේට ප්‍රසන්නව දිවි ගෙවීටත් අවස්ථාවක් වන්නට සැලස්සුව මැනව. මේ කිදේ ඔබවහන්සේගේ පුතනුවන්වන ජේසු ක්‍රිස්තු ස්වාමීන්වහන්සේගේ නාමයෙන් අපට ලැබේවා ආමෙන්.

## ජුබිලියේ වගතුග

ජීවත්වන අප සැමට ජීවිතයේ සැමරිය යුතු වැදගත් අවස්ථාවන් ලෙස උපත, විවාහය, පූජක-පැවිදි පොරොන්දු ගැනීම වැනිදේ ගත හැක. එවැනි අවස්ථාවල අනිත සිද්ධීන් සැමරීම, සංවත්සර හා ජයන්ති උත්සව පැවැත්වීම නිසඟයෙන්ම සිදුවිය යුත්තකි.

දේවස්ථානයෙ රිදී ජයන්ති යනුවෙන් අදහස් කරන්නේ හුණුවැලි ගල් සිමෙන්ති ආදියෙන් සැදුණු සිත් පිත් නැති මහ ගොඩනැගිල්ලක ජීවමාන සමාජ සංකේතයකි. එය සමාජයේ නිවස්නයයි දේවස්ථානයේ ආරම්භය හා පැවැත්ම සමාජයේ ආරම්භය හා පැවැත්මයි. මේ අනුව දේවස්ථානයට විසිපස් වසරක් පිරිම යනු ක්‍රිස්තුන් වහන්සේගේ අතින්ද්‍රිය ශරීරය වන ජීවමාන සමාජයක විසිපස් වසරක සැමරීමයි. එසේ නම් අප පවත්වන මෙම ජයන්තිය එහි ජීවමාන සමාජය පිළිබඳ ජයන්තියක්ය යන්න කල්පනාවට ගැනීම වැදගත්ය ( 1 පේදුරු 2 / 1-5) ශු බයිබලය තුලින් දැක්වෙන්නේ ජයන්ති උත්සවය හුදු සමාජ සිරිතක් නොව එය අනාදියේ පටන් මිනිසාට ප්‍රේම කරන දෙවියන්වහන්සේගේ අණකි. ඒ සමගම එම වර්ෂය හෝ ජුබිලි වර්ෂය ආරම්භයේදී පූජකවරුන් විසින් නාද කරන හොරණෑ ශබ්දය අනෙකුත් ජයග්‍රාහීක අවස්ථාවල සාමාන්‍ය ජනයා විසින් කරනු ලබන අනෙකුත් හොරණෑ ශබ්දයන්ට වඩා ගාම්භීරතාවයක්ද ගැඹුරු අධ්‍යත්මිකතාවයක්ද පිළිඹිඹු කරන බව ශු බයිබලයේ ජෝෂුවාගේ පොතේ හයවන අදියරයෙන් පෙන්වා දෙයි. පිරිපුන් ලෙස

නිදහස විමුක්තිය ලැබූ ජනතාවගේ ප්‍රතිඝෝෂාව " ජුබිලිය " ලෙස වචනයෙන් අදහස් විනි.

සය දිනකට පසු පැමිණෙන සත් වැනි දනය සබත් දිනය වූවා මෙන්ම සය වසරකට පසුව පැමිණෙණ වසර සබත් වර්ෂය විය යුතු විය. සියලු ආකාර වගා කටයුතුවලින් ද, අස්වැන්න නෙලීමෙන් හා අටු කොටු පිරවීමෙන් ද නිදහස් ව විශ්වාසයේ වර්ෂයක් ලෙස දෙවියන්වහන්සේ වෙත එල්ලවෙමින් ගත කිරීමට නියම වුණු එම වර්ෂය තුළ සබත සම්බන්ධයෙන් ඉටු විය යුතු යුතුකම් කොටසක් ද විය. ඒවා නම්, පොදුවේ සමාජයට, විශේෂයෙන් පීඩිතයින්ට නිදහස විමුක්තිය ගෙන දීමේ ක්‍රියාවන් විය. මේ ආකාරයෙන් පවත්වනු ලබන සත් වසරක කාල සීමා සතකින් පසුව එනම්, ( 7 ෆ 7 ෆ 49) වර්ෂ හතලිස් නවයක් ඉක්මවීමෙන් පසුව පැමිණෙන පනස් වැනි වර්ෂය ජුබිලි වර්ෂය විය. එය ජුබිලි සබතක් ලෙස පැවැත්වීමට ස්වාමීණ් වහන්සේ ජුදා ජනතාවට අණ කොට තිබිණි. ඒ සම්බන්ධටෙන් නියමව තිබූ වත් පිළිවෙත් " ලෙවි කතාවෙහි " සඳහන් වේ. " නුඹලා දේශය මුලුල්ලේ හොරණෑව පිඹපල්ලා... එසේ පනස් වැනි වර්ෂය ශුද්ධ ලෙස පවත්වා දේශයෙහි සියලු වැසියන්ට නිදහස ප්‍රකාශ කරපල්ලා... එය නුඹලාට ජුබිලියක් වන්නේ ය... " (ලෙවි 25.9-1-) අප ස්වාමීන්වහන්සේ ගේ වචනයෙන් වැටහී යන්නේ මෙම ජුබිලි

වර්ෂය තුළ :

- ස්වාමීන් වහන්සේගේ පොරොන්දු වැසියා කෙරෙහි ඉටු වීම පිළිබඳව ප්‍රීතිය ප්‍රකාශ කිරීමකි.
- ණය බරින් පීඩිතයන්ට නිදහසක්.
- ඉඩකඩ අහිමි වූවන්ට ඒවා නැවත ලබා දීමක්.
- වහලුන් නිදහස් කර හැරීමක් හා
- ජන්ම දේශය හැර ගියවුන් නැවත ඒ කරා පැමිණීමක් ද සිදු විය යුතු බවයි.

එනම් ජුබිලි වර්ෂය තුළ දුගියන්ට, පීඩිතයන්ට විමුක්තියක් නිදහසක් ලැබී පාපිෂ්ඨයන් පාපයෙන් හැරී එමින් සමාජය නවතාවයකට පත් වන බවයි. ඒ අනුව ජුබිලි යනු නව සමාජයක් නැතහොත් පරණ තත්ත්වයෙන් වෙනස් ව නිදහස අත් දකින සමාජයක් විසින් නගන නිදහසේ ප්‍රීති ඝෝෂාවයි.

පුරාණ ගිවිසුම්, ජුදා සමාජයේ පෙර සඳහන් වූ පරිදි ජුබිලි උත්සවය සැමරූ නමුත් සාමාන්‍ය වශයෙන් අවුරුදු පනහක් පාසා පැමිණෙන වර්ෂය ශුද්ධ වූ වර්ෂය ලෙසට නම් කර එය ජුබිලි වර්ෂයක් වශයෙන් සමරන ලෙසට ශුද්ධ වූ සභාව විසින් නිල වශයෙන් පළමු වරට ප්‍රකාශ කරන ලද්දේ **1342** දී සවැනි ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමන් විසිනි. ඉන් පසු **1956** දී සවැනි උර්බානු ශුද්ධෝත්තම පියතුමා එය වසර **33** ට වරක් පවත්වන ලෙස දැන්වීය. ඒ ලෙස විසි වර්ෂ අවසානයන් හි ශුද්ධෝත්තම පියතුමන්ගේ ප්‍රකාශන මත ශුද්ධවූ වර්ෂ සම්මත කාල සීමාවකට පෙර ද සමරන ලදී එසේ නමුත් **1470** දී දෙවන පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් සාමාන්‍යයෙන් සෑම පනස් වසරක් හෝ තිස් තුන් වසරක් වෙනුවට සෑම විසි පස් වසරක දී ජුබිලි උත්සවය පවත්වන ලෙස ප්‍රකාශයක් නිකුත් කරන ලදී. මෙම චාරිත්‍රය අදත් සමාජ චාරිත්‍රයන් අතර ගැවසේ.

මෙම කරුණු අනුව මත්තේගොඩ කිතුණු ජනතාව වශයෙන් අප මේ පවත්වන රිදී ජයන්තිය සාර්ථක කර ගනු සඳහා ජයන්තියක තිබෙන ඓතිහාසික හරය අපගේ එදිනෙදා දිවිය සමඟ සම්බන්ධ කර ගනිමු. එවිට සැබෑ නිදහසක් අත් දකිමු. රිදී ජයන්තිය සැමරීමත් සමඟ දේවස්ථානයේ ස්වර්ණ ජයන්තියට ප්‍රබල අත්තිවාරමක් දමමු. මේ අත්තිවාරමේ මල් ඵල තව වසර විසිපහකින් දැකීමට දැනට මත්තේගොඩ වෙසෙන කතෝලික ජනතාවට අවස්ථාව ලැබේවා යි පතමි.

ගරු රොහාන් ද අල්විස් පියතුමා
මීසම් භාර පියතුමා



Message from his Eminence

***Malcolm Cardinal Ranjith***

It is with much pleasure that I Pen these few words to the parishioners of St. Jude's church Mattegoda, celebrating the silver jubilee of 25 years. The dedication of the parishioners towards the noble cause of improving the house of the Lord is commendable. Despite the limited resources and populace, the church has grown to a strength of 150 families at present. As you rejoice in the Lord on this day of celebrations be thankful to the Almighty God for the abundant blessings he has bestowed upon you and incessantly seek his guidance for the future too.

May God bless each and every one of you to be a true gift to the church and to the world.

A happy and graceful jubilee to all of you!

*Malcolm Cardinal Ranjith*
Archbishop of Colombo



Message from his Lordship

## Most Rev. Dr. Maxwell Silva

Let me wish you a very happy Jubilee Feast to the Parish Priest Fr. Rohan De Alwis, Fr. Dinush Gayan and all the parishioners. May the blessings of St. Jude be with you always.

As the parishioners of St. Jude's church, Mattegoda, rejoice in the celebration of the much-awaited event of their calendar; the silver jubilee of 25 years, it gives me immense pleasure to pen these few words. Inspired by the Son of God's words to our forefathers "you are Peter and on this rock, I will build my church" (Matthew 16:18) we the Christian community has devoted our lives to building and developing the House of God. Accordingly, since its inception in 1992, it is no secret that St. Jude's church has grown in faith and multiplied its community to its present state and will continue to do so in the future.

Dear parishioners, as you surround yourself in the jubilee celebrations of your patron saint, be thankful to the Lord our God for his kindness that took us through life's challenges and his mercy that made us children of God.

May God Bless You All

+Maxwell Silva

Most Rev. Dr. Maxwell Silva
Auxiliary Bishop of Colombo



*Devoted, responsible, dedicated & committed children of God*

## Rev. Fr. Rohan De Alwis

it is with profound joy that I present this message of Felicitation at the Silver Jubilee of St. Jude's Church, Mattegoda.

Originally, the Catholic Community of Mattegoda was formed with the Catholic Government workers who had come from various parts of the Country. Later the others joined them. Actually, it was a good mixture.

In the beginning the Catholics of Mattegoda had much hard time to practice their religion. They had no common place to worship their living God. They went from place to place, house to house to celebrate the Eucharist.

In 1987, Rev. Fr. Marcus Ferdinandez and Fr. Robinson Wijesinghe laid the foundation stone to build a Permanent House of God for the People of Mattegoda. People welcomed this bold step and contributed very generously with their labour, with their money and with their lives. At the Final stages Fr. Sunil de Silva, Fr J.D Anthony dedicated their lives to fulfill their Hope. In 1992 MOST REV. DR. NICHOLAS MARCUS FERNANDO then the Archbishop of Colombo declared open and blessed this Church.

Today, the People of Mattegoda are blessed to have an opportunity to celebrate the Silver Jubilee of their Church. During this twenty-five years, they have not only completed the most of needs of the church, but also they have grown as devoted, responsible, dedicated and committed children of God. I am really pleased with you.
Ad Multos Annos

Rev. Fr. Rohan De Alwis
Parish Priest Pannipitiya



*"Tell the Heavens and Earth to celebrate and sing!*
*Command every mountain to join in song!"*

Isaiah 49:13

## *Rev. Fr. Dinush Gayan Winston*

It is indeed a joyful and a memorable milestone in our church history that we celebrate, the 25th Jubilee of St. Jude's Church, Mattegoda. It must have undoubtedly been a journey through thick and thin; numerous failed efforts, innumerable amount of arguments and unending heart-breakings which has led to what we experience now, a guided flock under the Almighty's care, receiving its spiritual nourishment in a comfortable and peaceful environment. I am immensely grateful to all clergy and layman who have shed their valuable blood, sweat and tears, to make us fortunate to experience this day of joy and togetherness. You have rightfully lived to the expectations of St. Jude as I quote, "Save others, snatch them out of the fire". Our words of thanksgiving is nothing in comparison to your rewards in Heaven; "He will not forget your work and the love you have shown Him, as you have helped His people and continue to help them." (Hebrews 6:10)

Nonetheless, I pray for each one of you that God our loving Father, would make this church feast a life changing event for each one of us and pray for the blessed intercession of St. Jude in all your years to come, in the very same way our patron saint has been interceding on behalf of us throughout the last successful 25 years.

"The Lord has done great things for us, and we are filled with joy!"

(Psalm 126:3)

God Bless You!

Rev.Fr. Dinush Gayan Winston
Asst.Parish Priest



*Founding Father of St. Jude's Church, Mattegoda*

## *Rev. Fr. Marcus Ferdinandez*

It gives joy to have penned these a few lines to the publication marking the silver jubilee of the church at Mattegoda dedicated to St. Jude an Apostle of Jesus. As I begin, nothing comes to my thoughts run back the corridors of the past years reminding of the unpleasant periods gone through without a permanent structure for worship and prayer in this vicinity. Being informed that the lands are available for sale in the area, we started acting immediately to purchase a few plots for the purpose. After convincing the authority of the fact it is an object of dire necessity, their Archbishop at a special encounter approved and released funds for the purchase of the land. All this was providential and we must thank Lord for his inspiration and guidance. We should be grateful to the Lord always for it.

Now it is the responsibility of the present generation to express it in a more tangible and fitting manner as baptized and committed Christians. In this context there is no other better way than to go back to the style of life of the early Christians according to the Acts of the Apostles chapter two:

> *"Many miracles were done because all believers continued together in prayer fellowship...... sharing and caring for others according to what each one needed in the community. The Lord added to their group those who were being saved ".*

Let us all keep ourselves to this Ideal and remain as God's witnessing people in this vicinity.

Wishing you God's blessings through the intercession of St. Jude the patron saint of Mattegoda catholic community.

Rev. Fr. Marcus Ferdinandez
Founding father of St. Jude's Church Mattegoda



*"The milestone of my humble life"*

## *Rev. Fr. Robinson Wijesinghe*

Beloved Parishioners of Mattegoda,

My first appointment as the very first Assistant Parish Priest of then-Pannipitiya Parish on the 15th August 1986 marks a milestone in my humble life. It was a fascinating time, under the guidance of Rev. Fr. Marcus Ferdinandez, to venture into a new experience amidst a wonderful community of faithful at Mattegoda. The time we celebrated the Sunday Mass and conducted the Sunday School at Mrs. Perera's home, division of zones, house visits, formation of a Parish Pastoral Council, and, above all, the organizing of the youth, laid the foundation towards an established parish community.

We thank late Bishop Raymond Peiris who helped us to purchase the land in 1987 and the dedicated youth of Mattegoda with whom we organized the first fund raising events for the construction of a church in future.

We remember with great respect and love all those who worked hand in hand with us during the period: 15 August 1986-88 and wish the present community God's all blessings and the intercession of Saint Jude for a joyful and meaningful celebration of the silver jubilee.

**Msgr. Robinson Wijesinghe**
Vatican



## ආධ්‍යාත්මික ජීවිතයේ නවෝදයක්
## ගරු සුනිල් ද සිල්වා පියතුමා

ශුද්ධ වු ජුඩ් මුනිඳුන්ට කැපකර ඇති පන්නිපිටිය මීසමේ මත්තෙගොඩ දෙව්මැදුරේ **25** වැනි ජුබිලිය නිමිත්තෙන් පළ කෙරෙන සමරු කළඹට මාගේ සුභාශිංසනය ද , සුභ පැතුම් ද එක් කරනුයේ ඉමහත් සතුටිනි.

**1990** වසරේ මා පන්නිපිටිය මීසමට සහයක පියතුමෙකු ලෙස පත්ව ආ කාලයේ මත්තෙගොඩ කතෝලික ජනතාව සමග අති උතුම් දිව්‍ය පූජාව පවත්-වන්නට රැස් වන්නට බොහෝ විට සිදු වූයේ නිවෙස් ඉදිරිපිට තිබූ පදික වේදිකාවේ සහ මහ පාරේය, විටෙක මාර්කට් එකේ උඩු මහලේ ද තවත් දවසක නිවෙසක් ඉදිරිපිට මහ පාරේද දිව්‍ය යාගය පැවැත්විය, මෙවැනි දුක් ගැහැට මැද වූවද කතෝලික ජනතාව තම විශ්වාසය තුල ජීවත් වූවාය, ඔවුන්ගේ ආත්මික බැඳීම එතරම් බලගතු විය,

දේවස්ථානයේ අත්තිවාරම දමා තිබුණේ ගරු මාකස් පර්ඩිනැන්ඩස් පියතුමාය, මා විසින් සිදු කලේ එතැන් සිට දේවස්ථානය ගොඩ නගා **1992** වසරේ සම්පූර්ණ කිරීමය, සියල්ලෝ එකතු වී මහ කැලය සුද්ද කර අත්තිවාරම තිබු තැන සොයා ගෙන දේවස්ථානය ගොඩනගන්න පුදුමාකාර උනන්දුවකින් වෙහෙසුනේය,

ජුබිලි පැවැත්වීම දේව ජනතාවගේ සම්ප්‍රදායකි. ශුද්ධවූ බයිබලයේ ලෙවී ව්‍යවස්ථාවේ **25** වන පරිච්ජේදයේ සඳහන් වන පරිදි සෑම වසර **50** කටම පසුව සබත් වසරක් ලෙස පැවැත්වීම දෙවියන්වහන්සේගේ ආඥාව විය. මෙම ඉපැරණි සම්ප්‍රදායන් ගරු කරමින් ඒ අනුව වත්මන් පරපුර ද කටයුතු කිරීම අප සභා මාතාව තුළ පවත්නා එකමුතුව විදහාපාන්නකි. ජුබිලි පැවැත්වීම තුළින් ආධ්‍යාත්මික ජීවිතයේ නවෝදයක් ඇතිවනවාසේම සාමුහිකව ඒකරාශීවී නව පුනර්ජීවනයක් ලැබීමට ද අවස්ථාවකි.

පෙර කල දී මෙන් නොව, වර්තමානයේ මීසම් සේවාව මහත් අභියෝගයනට ලක්ව ඇත. මෙම ජුබිලි උත්සවය මඟින් සියලු ජන සංඝ සමගින් සමඟිය, සහජීවනය තුළින්, සාමයෙන් වැඩ කටයුතු කළ හැකි සමාජයක්, කතෝලික සංඝයක් නිර්මාණය කිරීම ඔබගේ ජුබිලි ප්‍රයත්නය විය යුතුය. මෙම ජුබිලි වසර තුළ ඔබ ලැබූ ආධ්‍යාත්මික ගුණාංගයන්ගෙන් ඔබ ජීවිත සරසා, ඔබගේ ජීවිත ආලෝකමත් කර ගනිමින්, ඔබගේ දූ දරුවන් ගේ ජීවිත, අසල්වැසි ජනතාව ගේ ජීවිත ආලෝකමත් කරන්න. ඔවුන්ගේ විශ්වාසය තහවුරු කරන්න, ශක්තිමත් කරන්න. ඔබගෙම මුතුන් මිත්තන්, ගිහි නායක, නායිකාවන් ගිය මඟ ඔබත් ගොස් ඔබගේ දූ පුතුන් වන අනාගත පරපුරට ඔබ සතු විශ්වාසය තිළිණ කිරීමට දායකවන්න.

ඔබගේ දෙව්මැදුර අද ජුබිලි ශ්‍රීයෙන් බැබලෙද්දී, ඒ ගමන් මඟ ගිය ඔබ කිතුනු සංඝය ගොඩනැඟීම සඳහා නොයෙකුත් අයුරින් දායක වෙමින්, සහ අනෙකුත් සියල්ලන්ගේ පරිත්‍යාගශීලි දායකත්වය බෙහෙවින් අගය කළ යුතු අතර, මාර්ගෝපදේශකත්වය ලබා දුන් එවකට සිටි අද විශ්‍රාමිකව සිටින අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු අග්‍රරාජගුරු හිමිපාණන් වහන්සේව සහ මා හා මත්තෙගොඩ කිතුනු සංඝය දිරිමත් කරමින් මීසම් පාලකව සිටි ගරු ජේ ඩී ඇන්තනි පියතුමා සහ ගරු ප්‍රැන්සිස් ප්‍රනාන්දු පියවරුන් ඔබ කිතුනු සංඝයේ ගිහි පැවිදි නායක, නායිකාවන් සිහිකර කෘතඥතාවය පළ කරනුයේ ඉමහත් සතුටිනි. ඔවුනට දේවාශිර්වාදය බහුලව නිරන්තරයෙන්ම ලැබේවා.

එසේම කතෝලික අප අතර අවංක සහෝදර සමඟියක් ඇත්නම් අන්‍යාගමික අප සහෝදර ජනතාව සමඟ ද අත්වැල් බැඳගෙන රටේ සමාජ උවදුරුවලට පිළියම් සැපයීමට අපට හැකි වනු ඇත.

මෙම දෙව්මැදුරේ **25** වැනි ජුබිලිය නිමිත්තෙන් මාගේ සුභාශිංසනය හිමි කරන අතර මෙම ජුබිලි වැඩ සටහන සාර්ථක වනු සඳහා දේවාසිරි පතා සිටිමි.

ශුද්ධ වූ ජුඩ් මුනිඳුන්ගේ ආරක්ෂාවත්, රැකවරණයත්
සදාකල් ඔබ සැමට ලැබේවා.

ගරු සුනිල් ද සිල්වා පියතුමා



*From a Parishioner to a Servant of the Lord*

## *Rev. Fr. Jude Sharman Fernando*

It gives me great pleasure to felicitate the Catholic community of Mattegoda as they celebrate the 25th jubilee of St. Jude's Church Mattegoda.

It is indeed a moment of joy and celebration for the Catholic community of Mattegoda especially for those who worked hard in planting the seed of faith in the hearts of the people and towards building the church for the Catholics who lived in and around Mattegoda.

Prior to being ordain a priest I belonged to Mattegoda Catholic community. Mattegoda Catholic community was emerged as another substation Church of Pannipitiya parish because of the deep faith that people had in God, and the love, brotherhood and unity that they shared with the community. In 1990s as we had no place to celebrate the Holy Mass. It was celebrated in houses of the Catholic community. That time Rev.Fr. Marcus Ferdinandez who was the Parish Priest of Pannipitiya was blessed by God to be instrumental in building a church for Catholic which was dedicated to St. Jude. And I was fortunate to be the first to ordained as a priest from Mattegoda. Our Lord Jesus says in the scripture, the harvest is plentiful but the labourers are few and invite us to pray for more workers in his vineyard. I wish and pray that Catholic community of Mattegoda generate more vocations to serve for God's Glory.

Happy to mention that at present Catholic population of Mattegoda has grown with the powerful intercession of St. Jude. As you celebrate the 25th anniversary of your church I wish every Catholic family belonging to St. Jude's church Mattegoda, God blessings and ever powerful intercession of St. Jude.

Happy and grace filled jubilee to all.
Rev. Fr. Jude Sharman Fernando
Dean of Gampaha



Witness of Faith

## *Rev. Sr. Madhavi Illangasinghe OP*

It is with great pleasure that I write this message of felicitation on the occasion of the silver jubilee of St. Jude's church Mattegoda in Pannipitiya Parish. You have come a long way enriching yourself in the faith your ancestors gave you. Facing courageously the hardest times and situations, you have witnessed your faith willingly by building this beautiful church, for St. Jude Thaddeus.

We are fortunate to have a martyr who sacrificed his life for the faith. In the time in which our own faith is much challenged in so many ways, St. Jude is really a source of strength for us. So, in this celebration of silver jubilee let us come to St. Jude for help and let us follow his example to be close to Jesus.

The church is an edifice of love and grace. I pray that countless graces and blessings will overflow especially during this Jubilee year and you will experience the intercession of St. Jude the helper of the desperate.

Thank you,
May God bless you.

Rev. Sr. Madhavi Illangasinghe OP



## ශූ ජුඩ් තදේවුස් මුනිතුමා

ඔක්තෝම්බර් මස **28** වන දිනට මංගල්‍ය යෙදී ඇති මෙතුමා පළමු සියවසේ ගලීලයේ උපත ලද්දෙකි. ශූ ජුඩ් ත්දේවුස් මුනිතුමාගේ පළමු නාමය ජුදාස් වුවද, පසුව පාවාදුන් ජුදාස් ගෙන් වෙන්ම හඳුනා ගැනීම සඳහා ජුඩ් තදේවුස් නමින් සඳහන් වේ. එහි තේරුම නම් "ධෛර්යවන්ත" යන්නයි. ඔහුගේ මව වන මරියා ක්ලියෝපාස් දේව මෑණියන්ගේ ඥාති සොයුරියකි. ජේසුතුමාගේ කුරුසිය පාමුල සිටියේද මැය බව කියවේ. මෙතුමාගේ පියා වන අල්පේවුස් ජෝසප්තුමාගේද, ඥාතිවරයකු බැවින් මෙතුමා ජේසුතුමන්ගේ ළඟම ඥාතිවරයෙකි. එමෙන්ම අපෝස්තුළුවරුන් **12** ගෙන් කෙනෙකි. ප්‍රසාද ස්නාපනයේ සිට අහස් නැගීමේ කාලය තුල ජේසු තුමා සමඟ ඔහුගේ ආශ්‍රය උන්වහන්සේගේ මුල් කිතුනු සභාව අතර සබඳතාවය වඩ වඩා තහවුරුකරයි. ජේසුතුමා සමඟ ජීවත් වීමෙන් ලද අද්දැකීම් සමූහය තුළින්, ජේසුතුමාගේ පාස්කු අභිරහස, බලගතු ලෙස දේශනා කළේය.

මෙතුමා පෙන්තකොස්ත දින ශුද්ධාත්ම බලය, ආලේපය ලැබූ බව, එතුමාගේ පිළිරුවේ හිස මත ඇති ගිනි දැල්ලෙන් පෙන්වයි. ශූ ජුඩ් මුනිතුමාගෙ දිවි පෙවෙතෙ ජනකතා හා බැඳි පවතින්නකි. ඉන් එක් කථා පුවතකට අනුව එඩෙස්සාහි රජු අබ්ගාර ලාදුරු රෝගීව මිය යන්නට යන විට ජේසු  තුමාට ලිපියක් යවමින් තමාව සුව කරන ලෙස ඉල්ලා ඇත. රජුව සනසනු සඳහා රෙද්දක් ගෙන තම මුහුණ පිසදැමූ කල එහි ජේසුගේ මුහුණ සටහන් වී ඇත. ජේසු ස්වර්ගාරෝහනයට පසු දින මෙම ලාංජනය රජු වෙත ගෙන ගොස් තැබූ විට ඔහු සුවපත් විය. පසුව ජුඩ් තුමා සිමොන් අපෝස්තුළු තුමා සමඟ පර්සියාවට ගොස් දේශනා කළේය. එහිදී ඔහුව පොලු වලින් ගසා තළා මරණයට පත්කළේය. බලාපොරොත්තු රහිත අවස්ථාවල පිහිටවන සාන්තුවරයා ලෙස මෙතුමා නම්කර ඇත.

එම්. මදූකා පීරිස්



## St. Jude Thaddeus

Apostle and Martyr (1st century)

St. Jude was the brother of St. James the Less and thus a cousin of our Lord. He is the author of the last canonical epistle of which Origen stated that it "contains strong doctrine in a few lines". It was to Jude's question during the Last Supper that our Lord replied that he manifests himself only to those who are faithful in keeping his commandments (cfr.Jn 14: 23-24).

There is a tradition that Jude preached the faith mainly in Palestine, but later went to Persia and Armenia, and suffered martyrdom there. The Emperor Domitian once had St. Jude's grandsons brought from Galilee to Rome, but released them when he realized that they were not political rivals. Owing to the similarity of his name to that of Judas Iscariot, Jude Thaddeus was rarely invoked in prayer, which makes it seems likely that seeking his intercession was seen as a final resort when all else failed. It is thus that his popularity as the patron saint of lost causes has greatly increased in recent times.

St. Jude Thaddeus believed to be a relative of Jesus Christ and one of his 12 Disciples, is the 'Saint of the Despaired', 'Hope of the Hopeless' as well as the 'Patron Saint of Impossible'.



*A Sincere Thank you!*

***Secretary, Mr. Niroshan Motha***

I am honoured to pen a few words as we celebrate the Silver Jubilee Feast of our church, St. Jude's Mattegoda.

This is a h istoric moment for our parishioners of Mattegoda, as we commemorate 25 years.

At the beginning we had only a few families from around the vicinity. I am happy to say, that at present there are around 200 families from the nine zones in the scheme and the surrounding areas.

Rev. Father Marcus Ferdinandez and Rev. Father Sunil De Silva took the initiative and built this beautiful church dedicated to St. Jude. I would like to say a very special "Thank you" to both of them. I must also remember the small catholic community who rallied round the priest to build this church in the year 1992. During the Past and at Present there are many Parish Priests and Assistant Parish Priests who have served our Parish in Pannipitiya and would like to thank each one for their support and guidance given to us spiritually to uplift our community. May God bless you all.

Niroshan Motha

Parish Council Secretary



*Inspiring a Souvenir*

## *Gillian Nugara*

The successful publication of this souvenir is attributed to the spirit, strength and cohesiveness of the parishioners of St. Jude's church, Mattegoda. The unified thoughts and collective efforts required for the task at hand was mastered by the youth and guided by the senior parishioners of the community. Inspired by the imperative to renovate the church and serve as a memento for the silver jubilee of 25 years, the souvenir is bound to bring back memories to the old and instill new ones amongst us youngsters. On behalf of the editorial committee, I wish to convey our sincere gratitude to all those who supported this holy cause.

May God Bless you!

Gillian Nugara,
Chief Editor,
Editorial Committee of St. Jude's Church

# ඵල දැරූ සිහිනයක මතකයන්

**(මෙය 1992 සමරු කලාපයේ රෙක්ස් පෙරේරා මහතාගේ ලිපිය ඇසුරින් සකස් කරන ලද්දකි.)**

ගෙවීගිය අතීතය පිළිබඳ මාගේ මතකය අවදි කරනුයේ ඉතා නිහතමානී සතුටකිනි.මාගේ මතකය දිව යන්නේ 1984 වර්ෂයටයි.මේ වර්ෂය වන විට මත්තෙගොඩ සංඝයේ පවුල් සංඛ්‍යාව පවුල් 6ක් වැනි ඉතා සුලු සංඛ්‍යාවක් විය. දිව්‍ය පූජාවට සහභාගී වීමට අප හට පන්නිපිටිය දේවස්ථානයට යාමට සිදුවිය.එම කාලවකවානුව තුල පොදු ප්‍රවාහන ක්‍රමයක් පවා මේ ප්‍රදේශය තුල ක්‍රියාත්මක නොවුණි.මේ හේතුවෙන් ඉරුදින දිව්‍ය පූජාව සදහා පැමිණි බැතිමතුන් හට පැය 4 පමණ කාලයක් ගමනාගමනය සදහා කාලය ගත විය.

ගරු මාර්ක්ස් ෆර්ඩිනැන්ඩස් පියතුමාගේ මග පෙන්වීම මත අපහට ඉරුදින දිව්‍ය පූජාව සති දෙකකට වරක් මත්තෙගොඩ සංඝයේ පැවැත්වීමට කටයුතු සලසාගත්හ. පසුව,වැඩිවන පවුල් සංඛ්‍යාව හමුවේ දිව්‍ය පූජාව නිවාස වල එළිමහනේදී පැවැත්වීමට සිදුවිය. එසේ කාලය ගත වෙමින් පවතින විට, පන්නිපිටිය මීසම සදහා ප්‍රථම සහකාර මීසම්පාලක පියතුමා ලෙස ගරු රොබින්සන් විජේසිංහ පියනම පත්විය. ඔහුගේ නායකත්වය යටතේ අප සංඝය තුල විශාල පිබිදීමක් ඇති විය.

දිව්‍ය පූජාව පැවැත්වීම සදහා දෙව් මැදුරක අවශ්‍යතාව දැඩිව පැන නැගිණි.එම සිහිනය යථාර්තයක් බවට පත් කරගැනීම සදහා ගරු රොබින්සන් පියනමගේ අධීක්ෂණය යටතේ බසාර් වෙළද සංදර්ශනය අති සාර්ථක ලෙස සංවිධානය විය. මෙම තීරණාත්මක මොහොතේදී අපගේ අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමස් පියනමගේ ආශිර්වාදයෙන් පර්චස් 70ක භූමියක් අපහට තිලිණ විය.

මත්තේගොඩ සංගයේ තවත් සුවිශේෂ සිදුවීමක් ලෙස ගරු ශාමෙන් ප්‍රනාන්දු පියතුමා අප සංඝයෙන් ප්‍රථම වරට පූජකවරය ලබාගත් පියනම ලෙස ඉතිහාසයට එක් විය.

වසර 1989 දී අපගේ නව සහායක පියතුමා ලෙස පත්වූ ගරු රංජිත් සිල්වා පියතුමන්ගේ නායකත්වය යටතේ මත්තේගොඩ සංඝය සඳහා දේවස්ථානයක් ඉදිකරගැනීමේ සිහිනයට මුල්ගල තැබීම සිදුවිය.ඒ අනුව වර්ෂ 1990 දී අපගේ නමස්කාර ගෘහයට මුල්ගල තැබීම සිදුවිය.

එසේ මල් එල දැරූ සිහිනය තාවකාලිකව යටපත් විය. එනමුත්, සංගය සඳහා අභිනවයෙන් තේරීපත්වූ ගරු ෆැන්සිස් ප්‍රනාන්දු සහ ගරු සුනිල් සිල්වා පියතුමන්ලාගේ දැඩි අධිෂ්ඨානය මධයේ තාවකාලිකව යටපත්වූ දේවස්ථානයේ ඉදිකිරීම් නැවත ආරම්භ විය.

මත්තෙගොඩ සංඝයේ එකමුතුකමේ ප්‍රතිඵලයක් ලෙස , දේව ආශිර්වාදය මධ්‍යයයේ මාස තුනක් වැනි කෙටි කාලයක් තුලදී ශාන්ත ජුඩ් මුනිතුමන්ට මෙම දෙවස්ථාන ගෘහය කැප කෙරුණි.

**පරිවර්තනය - බර්තා සිමන් මහත්මිය**

## "Memories"

Memories go back to year 1984, when our community was only five to six families from Mattegoda. The nearest church was Pannipitiya. Due to the non-availability of public transport we had to travel nearly 4 to 5 hours to attend mass. We consulted the parish priest Rev. Fr. Marcus Ferdinandez regarding the possibility of having mass at Mattegoda at least once every fort-night. Our humble request was accepted and the first mass was held with a group of 20 people at my residence. As the devotees multiplied by number, we had masses every fort-night in different houses.

After some time, we were blessed with the first Asst. Parish Priest Rev. Fr. Robinson Wijesinghe, under whose leadership many societies were organized. More families moved into the housing scheme, where we found it difficult to accommodate the devotees, which resulted in open air masses in the same premises.

We then thought of having our own centre for conducting mass. Under the guidance of Rev. Fr. Robinson, we started raising funds and the notable achievement was where we had a Fancy Bazaar with a net profit of Rs. 35,000. Meanwhile, we were able to welcome his Lordship Rt. Rev.Dr. Oswald Gomis to our scheme and his Lordship gifted us a land of 70 perches, as a result of the untiring efforts mode by Rev. Fr. Robinson.

We organized ourselves as one family and conducted many religious events. The first priest from Mattegoda Rev. Fr. Sharman Fernando was also ordained during this period.

In 1989, we were gifted with Rev. Fr. Ranjan Silva who encouraged us to restart on our fund-raising projects with the guidance of the two parish priests who laid the foundation to our church in the year 1990. Due to the transfers of both the priests, no progress was made with regard to the construction. With the grace of God, Rev. Fr. Francis Fernando and Rev. Fr. Sunil Silva joined our community in the year 1990. They became the driving force behind our success story. We were organized and achieved our goal, we build up the church within 3 months and dedicated it to St. Jude.

Extract from the article "Memories"
by Mr. Rex Perera – year 1992

## 2017 බර්කා සීමන් මහත්මිය පවසන පරිදි

මත්තෙගොඩ සංඝයේ විශ්වාසකයින් වන අපි දැන් ධාර්මික ලාභය භක්තියෙන් යුතුව භුක්ති විඳිමින් සිටිමු. මේ මොහොත වන විට අපගේ ශක්තිය වී ඇත්තේ අප වර්තමාන මීසම් පාලක පියතුමන් වන ගරු රොහාන් ද අල්විස් සහ සහයාක පියතුමන් වන ගරු දිනුෂ ගයාන් යන නායක එඬේරාණන් දෙපළ හා ගරු මාධවී ඉලංගසිංහ පැවිදි සොයුරිය වේ. අප අද දින මෙලෙස අභිමානයෙන් සිහිපත් කරන මත්තෙගොඩ සංඝය ගොඩ නැගීමට අතීතයේ දායක වූ සියල්ලන්ට අපගේ ගෞරවනීය ස්තුතිය අප මෙම අවස්ථාවේ පුද කිරීමට කැමැත්තෙමු. මන් ද යත් මෙම සිහිනය සදාකාලික සිහිනයක් නොවී යථාර්තයක් බවට පත් වූයේ එම උදාර මිනිසුන් සිදු කළ කැප කිරීම්වල ප්‍රථිඵලයක් බැවිනි.

අප දේවස්ථානය මේ දක්වා ආ ගමනට අධ්‍යාත්මිකව පෝෂණය කරමින් මග පෙන් වූ හා මීසම් කෙත අස්වැද්දූ අතීත පූජක පුතුන් ලෙස

### මීසම් පාලක පියවරුන්

| | |
|---|---|
| ගරු මාකස් ෆර්ඩිනැන්ඩස් පියතුමා | (1982 - 1990) |
| ගරු ජේ.ඩී. ඇන්තනී පියතුමා | (1990 - 1991) |
| ගරු ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමා | (1991 - 1992) |
| ගරු ක්‍රිස්ටෝපර් ජුලියස් පියතුමා | (1992 - 1996) |
| ගරු මික පියතුමා | (1996 - 1997) |
| ගරු සිසිල් කුමාර පියතුමා | (1997 - 1999) |
| ගරු වික්ටර් ජයමාන්න පියතුමා | (1999 - 2003) |
| ගරු ග්‍රෙගරි ප්‍රනාන්දු පියතුමා | (2003) |
| ගරු ඉග්නේෂස් වර්ණකුලසිංහම් පියතුමා | (2003 - 2005) |
| ගරු ලලිත් පෙරේරා පියතුමා | (2005 - 2010) |
| ගරු බ්ලේස් කුරේ පියතුමා | (2010 - 2013) |
| ගරු ටිරෝන් පෙරේරා පියතුමා | (2013 - 2017) |
| ගරු රොහාන් ද අල්විස් පියතුමා | (2017 සිට) |

### සහායක පියවරුන්

ගරු රොබින්සන් විජේසිංහ පියතුමා
ගරු රන්ජන් සිල්වා පියතුමා
ගරු සුදත් ගුණතිලක පියතුමා
ගරු සුනිල් ද සිල්වා පියතුමා
ගරු රොෂාන් ප්‍රනාන්දු පියතුමා
ගරු කාල්ටන් සිල්වා පියතුමා
ගරු මේරියස් ක්‍රිෂාන්තස් පියතුමා
ගරු අර්නස්ට් ද මැල් පියතුමා
ගරු ප්‍රසාද් පෙරේරා පියතුමා
ගරු ක්ලෝඩ් නෝනිස් පියතුමා
ගරු හිෂාන්ත පෙරේරා පියතුමා
ගරු චමින්ද වනිගසේන පියතුමා

ගරු ලක්නාත් කුරේ පියතුමා
ගරු ගීතාල් ඇනස්ලි පියතුමා
ගරු ෂාමි දසනායක පියතුමා
ගරු සුරංග ෆොන්සේකා පියතුමා
ගරු රසික ලෝරන්ස් පියතුමා
ගරු රුවන්ත කුමාර පියතුමා
ගරු සුමිත් රොෂාන් පියතුමා,
ගරු දිනේෂ් කීර්තිසිංහ පියතුමා,
ගරු තුසිත සෝලංගආරච්චි පියතුමා,
ගරු ජයශාන්ත පියතුමා
ගරු දිනුෂ් ගයාන් වින්ස්ටන්

හා සියළු ගරු කන්‍යා සොයුරියන්ගේ උදවු උපකාර මධ්‍යයේ ශු. ජුඩ් මුනිඳුන්ගේ මධ්‍යස්ථකමින් අප ආදර දෙව් පියාණන්ගේ නොමඳ ආශිර්-වාදයෙන් අපි සියළු දෙනා මත්තෙගොඩ ශු. ජුඩ් තදෙවුස් මුනිඳුන්ගේ රිදී ජුබිලිය සතුටින් සමරමු.

*With Best Wishes from*

**Shane, Nilanthani & Maria**

*Well Wisher from*

**St. Mary's Church, Dehiwela**

*With Best Wishes from*


**George Hettiarachchi & Family**

*With Best Wishes from*

**Marie Catherine Wanasinghe**

*In Thanksgiving to St. Jude for the favours received*

**Ashley, Lorraine & Trevin**



**St. Jude's Church. 25 years ago**



**St. Jude's Church, at present**



St. Vincent De Paul Society



The Parish Council



Sunday School Teachers Union



The Altar Servers



The Choir



The Youth Society

කේක් ඇනවුම් බාරගනු ලැබේ.

**Maduka : 0771 895 766**

*In Thanksgiving to St. Jude*

*for the favours granted*

**Francis Perera & Family**

*In thanks giving to St. Jude From*

**Ainsley, Renu, Ruchike, Rumali and Ruwantha**

*Well wishes from*

**St. Mary's Parishoners**

*With Best wishes from*

**Malinga Perera & Family**

# අපගේ විශේෂ ස්තූතිය

- මෙම ජුබිලිය මහෝත්සවය සාර්ථක කර ගැනීමට අප හට අවශ්‍ය දේව වරප්‍රසාදයන් ලබා දුන් අප ආදර දෙවි පියාණන්ට හා අප වෙනුවෙන් නිරන්තරයෙන් මැදිහත් වූ දේව අම්මාටත්, ශු. ජූඩ් තදෙවුස් මුණිතුමන්ට,
- රිදී ජුබිලියේ සමරු කලාපය සඳහා සුභාසිංශන පණිවුඩ හා ආශිර්වාද අප වෙත එවූ කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ට හා අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් ඇතුලු සියළුම ගරු පියවරුන්ට,
- සෑම කටයුත්තකදීම අප සෑම දිරි ගැන්වූ අප මීසම් පාලක පියතුමා හා සහයක පියතුමන්ට ද ගරු මාධවී ඉලංගසිංහ කන්‍යා සොහොයුරියට ද,

- නුවාන හා දිව්‍ය පූජාවන් පවත්වනු ලැබූ ගරු සාගර ජයමාන්න (දි.ස.නි.)පියතුමන්ට,

- අප දේවස්ථාන අරමුදල සඳහා මුදල් එකතු කිරීමට උපකාර වූ
  - ශාන්ත ජුසේ මුණිදුන්ගේ දේවස්ථානය- නුගේගොඩ
  - ත්‍රිත්ව භවන දේවස්ථානය - අත්තිඩිය
  - ශාන්ත මරියා දේවස්ථානය - දෙහිවල
- ලොතරැයි ටිකට්පත් ත්‍යාග සඳහා අනුග්‍රහය දැක්වූ හා විශේෂ මුදල් ආධාර ලබා දුන් සැමට,
- සමරු කළඹ මුද්‍රණය කල Mariyana Printer හි ඇනස්ලි පෙරේරා මහතා හා කාර්ය මණ්ඩලයට,
- ජුබිලි මංගල්‍යය සාර්ථක කර ගැනීමට නන් අයුරින් සහය දැක්වූ මත්තේගොඩ සංඝයේ සියලු සැදැහැවතුන්ටත් එමෙන්ම පන්නිපිටිය මීසම් සංඝයේ සියලු දෙනාටත්,

**අප හද පිරි ප්‍රණාමය පුද කරමු.**

## සමරු කලාපයේ කමිටු සාමාජිකයන්

ජිලියන් නුගාරා

ශොභාන් දසනායක

ශෙහාන් වඩිනම්බු

සියළු මත්තෙගොඩ තරුණ සමිති සාමාජික සාමාජිකාවන්

මොවුන් පිටුපස සිට දිරිමත් කරමින් මඟ පෙන්වූ අප

ගරු පියතුමන්ලා දෙපළ ද ගරු පැවිදි සොයුරිය හා වැඩිහිටියන්